**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2018**

---

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි (එස්එෆ්) සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල iv වාවස්ථාවේ 4.04(අ) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර ඇතුලත් වූ අංක 5516 එල්කේ හා 5517 එල්කේ දරන ගිවිසුමේ 11බී 3 වගන්තියේ 2 වන උප ලැයිස්තුව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

---

වැඩසටහන් ණය ගිවිසුම අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සැපිරීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහන් ක්‍රියාකාරකම් ප්‍රතිඵල පදනම් (lending mode) ක්‍රමය අනුව ක්‍රියාත්මක වේ. වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 125,916 කට සමාන එජඩො මිලියන 961.2 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය පිළිවෙලින් රු.මිලියන 28,708.23 කට සමාන එජඩො මිලියන 200 ක්ද රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100ක්ද බැගින් ලබාදීමට අපේක්ෂිතය. තවද, ඉතිරි රු.මිලියන 84,107.77 න් රු.මිලියන 68,093 ක් හා රු.මිලියන 16,014.77 ක් පිළිවෙලින් ශ්‍රී ලංකා රජය හා අනෙකුත් ප්‍රභවයන් විසින් මූල්‍යායනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2014 වර්ෂයේ සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2021 ජූනි වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.1 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ වියදම් ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගනන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතිය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතියේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගනන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| 01. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මුද්‍රණ පුහුණු ආයතනය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) පරිච්ඡේදය පරිදි 2019 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | - | අදාල ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන සම්බන්ධයෙන් ඒකාබද්ධ වියදම් ප්‍රකාශනයේ ඇතුලත් කර තිබූ මූල්‍ය තොරතුරු සංසන්දනය කිරීමට නොහැකි විය. | බොහෝ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන සඳහා පාලක මණ්ඩල සාමාජිකයින් පත් කර නොතිබීම නිසා නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ප්‍රධාන මූල්‍ය නිලධාරීන් විසින් ඒකාබද්ධ වියදම් ප්‍රකාශන තුල ඇතුලත් මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කල යුතුව ඇත. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | අපේක්ෂිත භෞතික ප්‍රගතිය<br>ඒකක / ප්‍රතිශතය | 2018 දෙසැම්බර් 31 දිනට ලබාකර ගත් කාර්යසාධනය<br>ඒකක / ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| 01. | (i) වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන 90 ක් අලුත්වැඩියා කිරිම. | පුහුණු මධ්‍යස්ථාන 25 ක් අලුත්වැඩියා කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සැපයීමේ හිඟයක් නිරීක්ෂණය විය. | වෘත්තීය පුහුණු අංශයේ ඉල්ලුම සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | සීමිත මූල්‍ය ප්‍රතිපාදන නිසා ඉදිකිරීම් කටයුතු වල බලාපොරොත්තු නොවූ පමාවක් සිදු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට ප්‍රතිපාදන ලබා දිය යුතුය. |
| | (ii) වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා නව මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම. | නව පුහුණු මධ්‍යස්ථාන 03 ක් ඉදිකර තිබූ අතර නව මධ්‍යස්ථාන 05 ක වැඩ ආරම්භ කර තිබුණි. | | | | |
| 02. | පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණුව ලබාදෙනු ලබන ආයතන 13 ක් හරහා ව්‍යාපෘතියේ නිපුණතා ආංශික සංවර්ධන අංශය විසින් රැකියා අනුබද්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ නිපුණතා ප්‍රමුඛතා අංශවල පුහුණු අවස්ථා වැඩිකරලීම හා රැකියා ස්ථානගත කිරීම සඳහා රු.මිලියන 40 ක් වැයකර තිබුණි. වෘත්තීය පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා පුහුණුවන්නන් 1760 දෙනෙකු බඳවා ගෙන තිබුණද ඉන් සියයට 21 ක් නියෝජනය වන පුහුණු වන්නන් 365 දෙනෙකු පුහුණු කාලසීමාව තුළ හැරගොස් තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සහතික පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම හා අයදුම් කිරීම හා පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීමේ කටයුතු ප්‍රමාද කිරීම | | | රැකියා අනුබද්ධ පුහුණු වැඩ සටහනේ ප්‍රතිඵලය සතුටුදායක ලෙස ලඟාකර ගැනීමට නොහැකි වනු ඇත. | 1. සිසුන්ගේ අනාගත සැලසුම් වෙනස්වීම් නිසා ඔවුන් පාඨමාලා හැරගොස් ඇත. | 1. වැඩසටහනේ අවසන් ප්‍රතිඵලය පුහුණු වන්නන්ගේ සේවා නියුක්ති ඉලක්කය වන අතර එම නිසා අඛණ්ඩ ඇගයීම් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. තවද, |

| | | |
|---|---|---|
| නිසා පුහුණු පාඨමාලා සම්පූර්ණ කල අනෙක් පුහුණුවන්නන් 915 දෙනෙකු සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (NVQ) නිකුත් කර නොතිබුණි. එසේම, නිපුණතා ආංශික සංවර්ධන අංශය, පුහුණුව සපයන්නන් සමඟ ඇතුලත් වී තිබූ පුහුණු ගිවිසුම ප්‍රකාරව සේවා නියුක්ති ඉලක්කය වූ සියයට 65 ප්‍රතිශතය ළඟා කර ගැනීමද නොහැකි වී තිබුණු අතර 2019 ජුනි 03 වන දිනට සත්‍ය සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 04 ක මට්ටමක පැවතිණි. තවද, පාඨමාලා අවසන් කර තිබූ 310 දෙනෙකුගේ තොරතුරු නිපුණතා ආංශික සංවර්ධන අංශය සතුව නොපැවතුණි. | | වෘත්තීය පුහුණුකරුවන් ඔවුන්ගේ පාඨමාලාවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට උනන්දු කල යුතුය. |
| | 2. පවතින පමාවීම් අවම කර ගැනීම සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර ඇත. | 2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනවශ්‍ය ප්‍රමාදවීම් මඟ හැර ගැනීම සඳහා කටයුතු කල යුතුය. මෙම වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක කරන බැවින්, මෙම තත්ත්වය මඟහැරවීමට නිවැරදිව පියවර ගත යුතුය. |
| | 3. සේවා නියුක්ත ප්‍රතිශතය සියයට 65 ක් ළඟාකර ගෙන ඇත. | 3. වැඩ සටහන යටතේ ලියාපදිංචි වන සිසුන්, වැඩසටහන් සම්පූර්ණ කිරීම සඳහා උනන්දු කිරීමට හා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ලබාගැනීමට උනන්දු කල යුතුය. |
| 03. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය මගින් ඩිප්ලෝමා පාඨමාලා 07 ක් පැවැත්වීමට අපේක්ෂා කරන ලද අතර, ඒ සඳහා සිසුන් 232 දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, රු.1,449,000 ක් වැයකර පලකර තිබූ පුවත්පත් දැන්වීම්වල සාවද්‍ය සහගත තොරතුරු ඇතුලත් කර තිබීම නිසා අදාල පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත අරමුණු ලභාකර ගැනීමට නොහැකි විය. | ප්‍රතිචාර දක්වා නොමැත. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කල යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01. | දඹුල්ල හා රත්මලාන කාර්මික විද්‍යාල විසින් පවත්වනු ලබන යතුරු පැදි හා ස්කූටර් අළුත්වැඩියා කිරීමේ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා රු.2,576,404 ක් වටිනා පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර එම කටයුතු 2019 අප්‍රේල් 30 දින විටද අවසන් කර නොතිබුණි. | පුහුණු උපකරණ නොමැති වීම පුහුණු පාඨමාලාවල ගුණාත්මක භාවයට අහිතකර ලෙස බලපානු ඇත. | ලංසු සුරක්ෂිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2017 ජූලි 09 දින ඇණවුම් අවලංගු කරන ලදි. | පුහුණු පාඨමාලාව ගුණත්වය සහතික කිරීම් වස් ප්‍රසම්පාදන මහ පෙන්වීම්වලට අනුකූලව අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |
| 02. | 2017 මාර්තු 15 දිනැති අංක 33 දරන අතිරේකයෙන් සංශෝධිත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.4.2 සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 ට අනුව ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම වෙනුවට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය මගින් (shopping method) රු.46,558,506 ක් වටිනා පුහුණු උපකරණ කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනය සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් මිලදී ගෙන තිබුණි. | ලංසු ක්‍රියාවලියේ තරඟකාරීත්වයක් නොමැති වීම. | ප්‍රතිචාරයක් නොදක්වන ලදි. | ලංසු ක්‍රියාවලියේ තරඟකාරීත්වය තහවුරු කිරීම පිණිස රජයේ ප්‍රසම්පාදන මහ පෙන්වීම් ක්‍රියා පිළිවෙල අනුගමනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන 02 ක් විසින් 2018 වර්ෂය තුල ගිවිසුම් අවසන් කල පහත දැක්වෙන ඉදිකිරීම් ව්‍යාපෘතිවල ඉතිරි වැඩ 2019 ජුනි 18 දිනය වන විටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2018 දෙසැම්බර් 31 දිනට එම ඉදිකිරීම් සඳහා වැයකල මුදල රු.මිලියන 101.08 ක් විය.<br>(i) පෙට්ටිගලවත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අඛණ්ඩ වැඩ<br>(ii) රත්තොට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අඛණ්ඩ වැඩ<br>(iii) ලව්ලේන් පුහුණු කිරීමේ ගොඩනැගිල්ලේ (අදියර 02) අළුත්වැඩියා කටයුතු, වෙනස්කිරීම් හා වැඩිදියුණු කිරීම්<br>(iv) දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත අළුත්වැඩියා කිරීමේ කටයුතු | ඉදිකිරීම් පිරිවැය වැඩිවීමේ හැකියාවක් පවතී. | | ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා ඉක්මන් පියවර ගත යුතුව ඇති අතර ප්‍රසම්පාදන මහ පෙන්වීම් අනුව ගැඹුරින් අගැයීම සිදුකර සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා ගත යුතුය. |

## 3.3 ස්ථානීය පරීක්ෂා කිරීම්වල නිරීක්ෂණ

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| රසායනාගාර ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් නොතිබීම නිසා රත්මලාන විශ්ව විද්‍යාල විද්‍යායතනයේ ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ සිසු ප්‍රයෝජනය සඳහා 2015 වර්ෂයේ මිලදී ගත් පිරිවැය රු.මිලියන 6.93 වටිනා රසායනාගාර උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි. | පසුගිය වර්ෂ 03 තුල දරන ලද වියදම්වලින් ප්‍රතිලාභ ලැබී නොතිබුණු අතර ක්ෂේත්‍රයේ දැනුම ලබාගැනීමකින් තොරව සිසුන් පාඨමාලාව හදාරා තිබුණි. තවද, ප්‍රසම්පාදනයෙන් අරමුණුගත ප්‍රතිලාභ පුහුණුවන්නන් සඳහා ලැබී නොතිබුණි. | රසායනාගාරයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය මෙම තත්ත්වය ඇති වීමට මූලික හේතුව වී තිබුණි. | සිසුන්ට අදාල උපකරණ භාවිතයට ගැනීමට හැකිවන පරිදි රසායනාගාරය ඉදිකිරීම් කටයුතු ඉක්මනින් අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව ගෙවීම්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ අධිභාර වෙනුවෙන් රු.886,801 ක මුදලක් ව්‍යාපෘති අරමුදල් වලින් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීම වෙනුවෙන් මෙම වියදම් දැරීම අදාල නොවීම. | පිළිගෙන ඇත. | ක්‍රියාත්මක කරවීමේ නියෝජ්‍යායතනය විසින් ව්‍යාපෘතියේ අරමුණු සඳහා වියදම් දැරීමට තදින් උපදෙස් දිය යුතුය. |

## 3.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලා 04 ක සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීමේ අරමුණින් අහංගම පැවති හෝටල් පාසල අළුත්වැඩියා කර සංචාරක හෝටලයක් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 121.81 ක් වැයකර තිබුණි. 2018 අගෝස්තු 31 දින වන විට අළුත්වැඩියා කිරීමේ කිරීමේ කටයුතු සම්පූර්ණ කර තිබුණද, 2019 මැයි 31 දින වන විටත් සංචාරක හෝටලයේ ක්‍රියාකාරකම් ආරම්භ කර නොතිබුණි. 2017 වර්ෂය තුල මිලදීගෙන තිබූ රු.මිලියන | වත්කම් අනිසි පරිහරණයට හෝ විනාශ වීමට හැකියාවක් පැවතීම. | පෞද්ගලික රාජ්‍ය හවුල් ව්‍යාපාර ආදර්ශ හෝටලයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා අවස්ථා කිහිපයකදී උත්සහ දැරුවද එය අසාර්ථක විය. කාර්ය මණ්ඩලය බඳවා ගැනිම සිදු කෙරෙමින් පවතී. | (i) තීරණ වෙනස් කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන කල යුතුව තිබුණි.<br>(ii) පුහුණු වන්නන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා හෝටලයේ මෙහෙයුම් කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

19.67 ක් පිරිවැය වූ පුහුණු උපකරණ හා රු.මිලියන 9.40 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විනාශවීමට ඉඩහැර නිෂ්ක්‍රීයව පැවතුණි. තවද, ඉදිකිරීම් කටයුතු සංචාරක හෝටලයක් බවට පත් කිරීමට සහ ඉදිකිරීම් වැඩ වෙනස් කිරීමට පසුවගත් තීරණය හේතුවෙන් පසුගිය වර්ෂ 03 තුල එම ඩිප්ලෝමා 04 සඳහා සිසුන් බඳවා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**3.6 මතභේදයට තුඩුදෙන කරුණු**

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 1. | තංගල්ල පුහුණු කිරීමේ විද්‍යාලය මගින් පවත්වනු ලබන පාඨමාලා 3 ක් සඳහා ISO 9001 – 2015 සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුල රු.479,924 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ මෙම පාඨමාලා ක්‍රියාත්මක කිරීමට ඇතුලත් කර තිබුණද, විශ්වවිද්‍යාලය එම පාඨමාලා පවත්වා නොතිබුණි. | ප්‍රතිඵල රහිත වියදමකි. | ප්‍රතිචාර දක්වා නොතිබුණි. | විද්‍යාලය තුල අදාල පාඨමාලා ඉක්මනින් ආරම්භ කිරීම සඳහා පියවර ගත යුතුය. |
| 2. | ධීවර අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 08 වන මහල අළුත්වැඩියා කිරීම සඳහා තෘතීය හා වෘත්තීය පුහුණු අධ්‍යාපන | අපතේ ගිය වියදමකි. | පූර්ව අනුමැතිය ලබාගෙන ඇත. පදිංචි වී වර්ෂයකට ආසන්න කාලයකින් පසුව බිම් මහලේ ඇති වූ හානිවීම් නිසා | අළුත්වැඩියා කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකිරීමට පියවර ගත |

කොමිසම 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 11.06 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ තොරතුරු අනුව අදාල ස්ථානය කාර්යාල කටයුතු සඳහා නුසුදුසු ස්ථානයක් වන අතර වර්තමානයේ දී කොමිසම අදාළ අරමුණ වෙනුවෙන් ප්‍රයෝජනය සඳහා භාවිතයට ගනු නොලැබේ.

තෘතියික හා වෘත්තීය පුහුණු කොමිසම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලුම් කර ඇත.

යුතු අතර අළුත්වැඩියා කටයුතු වල අඩුපාඩු වහාම හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.